**වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2015**

වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹී 2009 ජුනි 29 දිනැති අංක 2477 එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය, 2009 ජුනි 29 දිනැති ප්‍රදාන අංක 0129/0130 එස්ආර්අයි (එස්එෆ්) සහ 2013 පෙබරවාරි 13 දිනැති 2977- එස්ආර්අයි (එස්එෆ්) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාතේ මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්ක සහ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය හා හලාවත ඇතුළත් ශ්‍රී ලංකාවේ උතුරු හා වයඹ වියළි කලාපීය නාගරික ජනගහනයේ භෞතික සුභසාධනය වැඩි දියුණු කිරීමයි. ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ සංශෝධිත මුළු පිරිවැය රු.මිලියන 19,165 කට සමාන එජඩො මිලියන 163.33 ක් වූ අතර ඉන් රු. මිලියන 11,809 කට සමාන එජඩො මිලියන 99.78 ක් හෙවත් සියයට 61.09 ක් ණයක් ලෙස සහ රු.මිලියන 2,649 කට සමාන එජඩො මිලියන 23.22 ක් හෙවත් සියයට 14.22 ක් ප්‍රදානයක් ලෙස ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ජල මූල්‍යායන හවුල්කරු පහසුකම සඳහා රු.මිලියන 228 කට සමාන එජඩො මිලියන 2 ක් හෙවත් සියයට 1.22 ක ප්‍රදානයක් ආසියානු සංවර්ධන බැංකුව හරහා සිදු කිරීමට නෙදර්ලන්ත භාර අරමුදල ද (නෙ හා අ) එකඟ වී තිබු අතර රු. මිලියන 4,479 කට සමාන එජඩො මිලියන 38.33 ක් හෙවත් සියයට 23.47 ක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 නොවැම්බර් 13 දින ආරම්භ කළ අතර 2013 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය 2016 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය හා ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිව තිබුණේද යන බව.

(ඉ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය හා ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(උ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) ණය හා ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය හා ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඊ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) වී අස්වැන්න අහිමි වීම මත ගොවීන්ට ගෙවිය යුතු රු. මිලියන 5.46 ක වන්දි වටිනාකම සඳහා ප්‍රතිපාදනය 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් රු.මිලියන 64.88 ක් වටිනා මෝටර් වාහන කාර්යාල උපකරණ යටතේ වර්ගීකරණය කර දක්වා තිබුණි.

(ඇ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ එළඹි අතුරු ණය ගිවිසුම යටතේ භාණ්ඩාගාරය විසින් අය කළ රු.මිලියන 68.50 ක පොලී වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් 2015 දෙසැම්බර් 31 දක්වා අයකළ රු.මිලියන 49.79 ක පොලී ගාස්තු වටිනාකමද ගිණුම් වලට ගෙන නොතිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩරය පිරිනැමීමෙන් පසු දින 60 ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි

කළ යුතුය. ව්‍යාපෘතිය සමග කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹී කොන්ත්‍රාත්කරුවන් තිස්දෙදෙනෙකු විසින් ඉහත සඳහන් අවශ්‍යතාවයන් වලට අනුකූල වී නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.12 වගන්තිය, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21 වන වගන්තිය හා 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 (3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදයට අනුව, එකතු කළ අගය මත බදු ගෙවීම් මාසික වාර්තා විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබූ එකතු කළ අගය මත බදු එකතුව රු. මිලියන 130.27 ක වටිනාකමක් විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිලිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය හා ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යායනය කිරීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ- ණය | | | | | | | |
| 2477 | 59.78 | 6,820 | | 7.51 | 1,052 | 32.74 | 4,331 |
| 2977 | 40.00 | 4,989 | 4,351 | 11.82 | 1,655 | 18.62 | 2,533 |
| ආසබැ- ප්‍රදාන | | | | | | | |
| 129 | 23.22 | 2,649 | | 2.74 | 384 | 13.07 | 1,682 |
| 130 | 2.00 | 228 | 620 | 0.20 | 28 | 1.65 | 206 |
| ශ්‍රීලංර | 38.33 | 4,479 | - | 5.12 | 717 | 17.78 | 2,226 |
| එකතුව | 163.33 | 19,165 | 4,971 | 27.39 | 3,836 | 83.86 | 10,978 |

අතාත්වික රේට පදනම් කර ගනිමින් සිදු කළ පිරිවැය ඇස්තමේන්තු කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා කරන ලද එජඩො මිලියන 113.33 ක ආරම්භක වෙන්කිරීම පසුව ණය ලබා දෙන නියෝජිතායතනය විසින් එජඩො මිලියන 163.33 ක් දක්වා වැඩි කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය විසින් අඛණ්ඩව ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමේ හා අරමුදල් උපයෝජනයේ අඩු ප්‍රගතියක් වාර්තා කරන ලදී. සංශෝධන කිරීමෙන් පසු වසර 2 ½ ක් ගත වී ඇතත් සංශෝධිත ප්‍රතිපාදනයෙන් එජඩො මිලියන 83.86 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.2 භෞතික ප්‍රගතිය

උතුරු හා වයඹ පළාත් වල නාගරික ජනතාවගේ භෞතික සමෘද්ධිය වැඩිදියුණු කිරීම පිණිස එම ප්‍රදේශ වල ජල සම්පාදන හා සෞඛ්‍ය ආරක්ෂණ කටයුතු කිහිපයක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර 2016 ජුනි 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 76 ක් පමණක් වී තිබුණි. තවද, මූල්‍ය හා භෞතික ඉලක්කයන් කාර්තුමය වශයෙන් දක්වමින් සමස්ත ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, ඉන් බැහැර වීම් හඳුනාගැනීම හා අවශ්‍ය පිළියම් ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි එම ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාලීන ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘති කාර්යයන් නිවැරදිව ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී පාලන උපකරණයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජලාශ 03 ක් නවීකරණය හා වී වගාව සඳහා පතියාකුලම් හා කට්කුලම් හී ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 66.65 ක ඇස්තමේන්තු පිරිවැයකට අවබෝධතා ගිවිසුමක් වවුනියාවේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් සහ වවුනියා දිස්ත්‍රික් ලේකම් සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය 2014 දී අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගැනීමකින් තොරව වවුනියාවේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉහත දක්වන ලද අවබෝධතා ගිවිසුමට සෘජුවම එළඹී තිබුණි.

(ii) ඉදිරිපත් කළ තොරතුරු අනුව, ඉඩමෙන් කොටසක් වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 4.61 ක ඇස්තමේන්තු පිරිවැයකට 2014 මැයි මාසයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පිරිනමන ලද අතර ඉන් රු.මිලියන 3.22 ක් මුදාහැර තිබුණි. කෙසේ වෙතත්, 2014 සැප්තැම්බර් වන විට නිමකළ යුතු කාර්යයන් 2016 මාර්තු වන විටත් නිම කර නොතිබුණි. වවුනියාවේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර කොමසාරිස් විසින් ව්‍යාපෘතිය විසින් ප්‍රේෂණය කරන ලද අරමුදල් අවභාවිත කිරීම හේතුවෙන් අදාළ වැඩ නිම කිරීමට නොහැකි බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වර්තමාන සහකාර කොමසාරිස් පසුව දන්වා තිබුණි.

(iii) ඉහත වැඩ නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන්, 2014 හා 2015 වී අස්වැන්න අහිමි වීම මත ගොවීන් වෙත රු.මිලියන 9.91 ක් වූ වන්දි මුදල් ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් අමතරව ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) වවුනියාවේ මතුපිට ජල සංවර්ධනය සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.මිලියන 956.82 ක ඇස්තමේන්තු පිරිවැයකට බද්ධ ව්‍යාපාරයකට 2013 වර්ෂයේ දී පිරිනමා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, උපකරණ හා සිවිල් වැඩ ප්‍රසම්පාදනය සඳහා විස්තරාත්මක සැලසුම්, දළ රූ සටහන් ඇඳීම්, පිරිවිතර, ප්‍රමාණ බිල්පත්, පිරිවැය ඇස්තමේන්තු, ටෙන්ඩර ලියවිලි සහ කොන්ත්‍රාත් සම්බන්ධ ලියවිලි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පිළියෙල කළ යුතුය. කෙසේ වෙතත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතීන් ලබා ගැනීමකින් තොරව පේරු ආරු ජලාශය ඉදිකිරීම සම්බන්ධ සැලසුම් වැඩ සියල්ල ව්‍යාපෘති උපදේශක සම්පූර්ණ කර තිබුණි.

(ii) පේරු ආරු හි නැවත පදිංචි කිරිමේ ප්‍රදේශවල එළිපෙහෙළි කිරීම් හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මිලියන 13.27 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු බවත් විචලන නියෝගයක් යටතේ රු.මිලියන 2.81 ක අමතර ගෙවීමක් සිදුකර තිබූ බවත් නිරීක්ෂණය විය. තවද, ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් සපුරාලිය යුතු නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා පිරිවැය ණය අරමුදල් යටතේ සිදු කර තිබුණි.

(ඇ) 2010 වර්ෂයේ දී පිරිනමන ලද වවුනියාවේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයක් සඳහා මහල් 03 කින් සමන්විත කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 64.30 අගයක කොන්ත්‍රාත්තුව 2013 ජනවාරි 24 දින නිම කර භාර දී තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු හා ව්‍යාපෘතිය අතර ඇතිවූ නොඑකඟතාවයන් හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් වැඩ සඳහා අවසන් ගෙවීම් පියවා නොතිබුණි.

(ඈ) 2013 මැයි මාසයේදී පිරිනමන ලද මන්නාරම හා වවුනියා දිස්ත්‍රික් ජල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධතිය 2015 දෙසැම්බර් 31 දිනට සියයට 66 ක අඩු ප්‍රගතියක් පෙන්වා තිබුණි. තවද, ජල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධතිය ඉදිකිරීමේදී එළන ලද නළ වල අඩුපාඩු 2014 සැප්තැම්බරයේ දී හඳුනාගෙන තිබූ අතර බාල තත්ත්වයේ නළ වෙනුවට ආදේශ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට නියෝග කර තිබුණි. කෙසේ වුවද, 2016 මැයි 31 දින වන විටත් නළ ආදේශ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු පියවර ගෙන නොතිබුණි.

(ඉ) රු. මිලියන 38.85 ක පිරිවැයකට 2013 වර්ෂයේදී පිරිනමන ලද මන්නාරමේ භූගත ජල සම්පත් සංවර්ධනය සඳහා වූ කොන්ත්‍රාත් 02 ක් 2016 මාර්තු 31 දිනට සියයට 49 ක අඩු ප්‍රගතියක් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, රු. මිලියන 610 ක පිරිවැයකට 2014 වර්ෂයේ දී පිරිනමන ලද හලාවත හා පුත්තලම මතුපිට ජල සම්පත් සංවර්ධනය සඳහා

කොන්ත්‍රාත්තුව සහ රු.මිලියන 3.81 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2014 වර්ෂයේදී පිරිනමන ලද හලාවත හා පුත්තලම ජල පිරිපහදු පිරියත ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්තුව 2016 මාර්තු 31 දින දක්වා සියයට 47 බැගින් වන අඩු ප්‍රගතියක්ද දක්වා තිබුණි.

(ඊ) සමස්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ වැඩ වලින් සියයට 16.5 ක් නියෝජනය වන කොන්ත්‍රාත් 04 ක් යටතේ කටයුතු 2014 වර්ෂයේ දී නිම කිරීමට අවශ්‍ය වුවද 2015 දෙසැම්බර් 31 දිනට සියයට 8 සිට සියයට 82 ක පරාසයක ප්‍රගතියක් දක්වා තිබුණි. ඊට අමතරව සමස්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ වැඩ වලින් සියයට 27 ක් නියෝජනය වන වෙනත් කොන්ත්‍රාත් 10 ක කටයුතුවල භෞතික ප්‍රගතිය 2015 දෙසැම්බර් 31 දිනට සියයට 15 සිට සියයට 88 ක පරාසයක පැවතුණි.

## 3.4 ව්‍යාපෘති අරමුණු වලින් බැහැරව උපයෝජනය කළ අරමුදල්

ව්‍යාපෘති කටයුතු වලට සහභාගී නොවූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයින් තිදෙනෙකුගේ රු.මිලියන 2.49 ක් වූ පාරිශ්‍රමික ශ්‍රී ලංකා රජයේ දායකයෙන් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

## 3.5 පූර්ව විගණනයන් මඟින් පෙන්වා දුන් නොවිසඳුණු විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වවුචර සහ අදාළ ආධාරක ලියකියවිලි නොමැතිවීම හේතුවෙන් 2008 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා රජයේ දායකත්ව අරමුදල්වලින් දරන ලද රු.මිලියන 7.8 ක් වූ වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. මාගේ පෙර විගණන වාර්තා වලින් මෙම තත්ත්වය අඛණ්ඩව පෙන්වා දී ඇති නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ණය හා ප්‍රදාන ගිවිසුම් මඟින් සිදු කළ එජඩො මිලියන 57 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමකින් තොරව, 2009 සිට 2013 වර්ෂය අතර කාලය තුළ ඉදිකිරීම් උපකරණ, ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය සඳහා රු.මිලියන 12.21 ක් වූ ශ්‍රී ලංකා රජයේ දායක අරමුදල් උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය.

## 3.6 මූල්‍ය පාලන ගැටලු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය සමඟ විධිමත් සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, රු. මිලියන 10,135.79 ක් වටිනා කෙරීගෙන යන සිවිල් වැඩ අගය 2015

දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.මිලියන 10,180.19 ක කෙරීගෙන යන සිවිල් වැඩ අගය සමඟ නොසැසඳුනු අතර රු.මිලියන 44.40 ක වෙනස සැසඳීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 ප්‍රකාරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘතියේ කටයුතු විගණනයට භාජනය කර නොතිබුණි.

## 3.7 පාරිබාහිර කාර්යයන්

ව්‍යාපෘති කටයුතු ආරම්භ කර වසර 5 ක් අවසන් වීමෙන් පසුව ගිණුම් කටයුතු සඳහා පරිගණක පැකේජයක් රු. 628,932 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. කෙසේ වෙතත්, අදාළ අරමුණු වෙනුවෙන් ඵලදායීව භාවිතා කිරීමට පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගත් අඩුපාඩු කිහිපයක් 2016 මැයි 31 දින වනවිටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.